# ලෙබනනය හා ලංකාව

ලෙබනනය ආක්‍රමණය කිරීම ගැන කිසිවකු ලිප්ටන් වටරවුමේ හෝ කොටුව දුම්රිය පොළ ඉදිරියේදී ඊශ්‍රායලයට විරුද්ධව පිකට්ටුවක් පැවැත්වූ බවට ආරංචියක් නැත. ඇතැම් විට ඒ පිකට් පවත්වන්නවුන් කෙළින්ම ඊශ්‍රායලයට විරෝධය පළකිරීම සඳහා ටෙල්අවිව් හෝ ඊශ්‍රායලයේ වෙනත් නගරයකට හෝ ගොස් ඇත්දැයි අපි නො දනිමු. ඒ එසේ නම් ඔවුන්ට ඊශ්‍රායලයට පාඩම් කිහිපයක්ම ඉගැන්වීමට තිබුණි. එමෙන්ම ඒ සමග ඊනියා ප්‍රබුද්ධයන්ට ද ඊශ්‍රායලයට ගැටුම් නිරාකරණය ගැන යමක් කියාදීමට තිබුණි. ඊශ්‍රායලයේ ජනමාධ්‍ය සමග සාකච්චා පවත්වමින් ඊශ්‍රායල් වැසියන් දැනුවත් කිරීමේ මාහැඟි කාර්යයටද ඉන් ඉඩක් ලැබෙන්නට තිබුණි. එහෙත් ඒ එකක් හෝ සිදුවූ බවට සාක්ෂි නොමැත. අඩුම තරමින් අර වසා දැමීමට නියමිත කසිකබල් සති අන්ත පත්තර කඩමාල්ලෙහි හෝ ඒ පිළිබඳ තොරතුරක් පළ නොවීය. මේ පඬියෝ ලෙබනනය පිළිබඳ නෑසූ කනින් නුදුටු ඇසින් සිටිති. එහෙත් ඇතැම් විට අද හෙටම ලෙබනනයේ සිටින ශ්‍රී ලාංකිකයන් ආපසු ගෙන්වා ගැනීමට ආණ්ඩුව නිසි පරිදි ක්‍රියාත්මක නොවී යැයි මේ පඬියන් මැසිවිලි නැගීමට ඉඩ ඇත.

බුදු දහම පාවාදීම යන මැයෙන් පොතක් ලියා බෞද්ධයන්ට යුද්ධ කිරීම හා නොකිරීම ගැන කරුණු කීමට ඉදිරිපත් වූ මහාචාර්ය තම්බයියා මහතාට යුදෙව්වන්ට කීමට දෙයක් නැත්ද? එවැනි දෙයක් ඇතත් ඒ කීමෙන් පලක් වේ දැයි තම්බයියා මහතාගේ අනුගාමිකයන් අසනු ඇත. ඊශ්‍රායලය තම්බයියලා කියන දේ ඇසීමට සූදානම් රටක් නොවේ යැයි ඔවුන් කියනු ඇත. අනෙක් අතට යුදෙව්වන්ගේ පරණ තෙස්තමේන්තුවේ ඇත්තේ දෙවියන් වහන්සේගේ ඇසට ඇසක්, දතට දතක් යන නියමය බැවින් යුදෙව්වන්ගේ රට වූ ඊශ්‍රායලයට වෙනත් ක්‍රියා මාර්ගයක් නොගත හැකි බවද ඔවුන් පෙන්වා දෙනු ඇත. එහෙත් ඊශ්‍රායලය ක්‍රියා කරන්නේ දතට දතක් ප්‍රතිපත්තිය මත පදනම්ව නොව දතට දත් ඇඳි දෙකම යන ප්‍රතිපත්තිය මත පිහිටාය. කෙසේ වෙතත් බටහිර ක්‍රිස්තියානි රටවල් ඉතිහාසයේ කිසිම දිනක වම් කම්මුලට ගැසූ විට අනෙක් කම්මුල හරවා නැත්තේ ඇයි දැයි ක්‍රිස්තු භක්තිකයකු වූ තම්බයියා මහතාට ඇසීමට හැකිවිය යුතුව තිබුණි. එහෙත් ඒ මහතා එසේ ඇසූ බවක් හෝ ක්‍රිස්තියානි පවුලක උපත ලත් අර නොවිකිණෙන සති අන්ත පත්තර කඩමාල්ලේ කතුවරයා හෝ වෙනත් ක්‍රිස්තියානි "ප්‍රගතිශීලියකු" ඇසූ බවක් හෝ සඳහන් නොවෙයි.

නිවට කරණවෑමියා දුටු විට නිකට පාන එළුවා මෙන් මේ සියල්ලන් බයිලා කීමට ඉදිරිපත් වන්නේ සිංහල බෞද්ධයන්ට ය. ඒ සිංහල යැයි කියා ගන්නා දේශපාලන පක්ෂවල නිවට නායකයන් නිසා සිදුවන කරුණකි. 1818 දී ඉංගිරිසින් විසින් සිංහලයන්ට තම නායකයන් අහිමි කරනු ලැබීමෙන් පසුව අද වන තුරුද සිංහලයන්ට තම සංස්කෘතියෙහි ඇති දැඩිවූ නායකයන් බිහිකර ගැනීමට නොහැකි වී ඇත. එයට ප්‍රධාන හේතුවක් වී ඇත්තේ බටහිර ක්‍රිස්තියානි අධ්‍යාපනය ය. දෙමළ මුස්ලිම් ජනයාටද ලැබෙන්නේ මූලික වශයෙන් බටහිර ක්‍රිස්තියානි අධ්‍යාපනයක් වුවත් ඔවුහු තම සංස්කෘතික මුල් ආරක්ෂා කර ගැනීමට පසුබට නොවෙති. අනෙක් අතට බටහිර ක්‍රිස්තියානි සංස්කෘතිය විසින් මෙරට සිටින සිංහලයන් පමණක් නොව සිංහල නොවන ජනයාද සිංහල බෞද්ධ සංස්කෘතියට එරෙහිව මෙහෙයවනු ලැබෙති. තම සොල්දාදුවන් එක්කෙනකු හෝ කිහිප දෙනකු හෝ පැහැරගනු ලැබූ විට ඊශ්‍රායල් ජාතිකයනට සාමය වෙනුවෙන් ඉවසීමට යැයි නෝර්වේ රජය කියා නැත. යුද්ධයේ ආදීනව ඊශ්‍රායල් ජාතිකයනට කියාදීමට මෙරට පල්ලි නිකායට අනුරූප යුදෙව් රාබ්වරුන්ගේ සමාජයක් එරට නැතිවීම සාමයට එල්ල කෙරුණු බලවත් පහරක් වෙයි. ඒ වෙනුවට ඇමරිකා එක්සත් ජනපද ප්‍රකාශ කර ඇත්තේ තම රටවැසියන් රැකගැනීමට ඊශ්‍රායලයට අයිතියක් ඇති බවය. ලෙබනනයේ කෙතරම් ප්‍රශ්න තිබුණද ඒ සියල්ල පසෙක තබා පසුගියදා ලංකාවට තම විශේෂ නියෝජිතයකු එවීමට ඇමරිකාව අමතක නොකළේය. ලෙබනනය ආක්‍රමණය කරද්දී මෙරට සාමය පවත්වාගෙන යෑම කෙතරම් අගය කළ යුතු ක්‍රියාවක් දැයි බටහිර දේශපාලන විද්‍යාඥයකු කියාදීමට ඉදිරිපත් වනු ඇත. මුළු බටහිර ලෝකයටම අද අවශ්‍ය වී ඇත්තේ ලංකාවේ සාමය පවත්වාගෙන යෑම මිස බටහිර ආසියාවේ හෝ වෙනත් තැනක සාමය පවත්වාගෙන යෑම නොවන බව පැහැදිලිය.

පශ්චාත් නූතනවාදීන්ට අනුව අද ඇත්තේ ඊනියා පශ්චාත් නූතනත්වයකි. එහෙත් ලෝක දේශපාලනයෙහි ඊශ්‍රායලය නමින් රටක් පිහිටුවූ දින සිට අද දක්වා ගුණාත්මක වශයෙන් සිදුවී ඇති වෙනස කුමක්ද? එසේත් නැතහොත්

© Prof. Nalin De Silva

විසිවැනි සියවසේ මුල භාගයෙන් ලෝක දේශපාලනය අද වන විට කෙතරම් වෙනස් වී ඇත්ද? ඊනියා මහේක්ෂ දේශපාලනයක් වෙනුවට අද ක්ෂුද්‍ර දේශපාලනයක් ක්‍රියාත්මක වේද? පශ්චාත් නූතනවාදීන්ට අනුව ලෝකයේ ඊනියා පශ්චාත් නූතන තත්ත්වයක් ඇත්තේ ලියෝතාද්ගේ පශ්චාත් නූතනවාදී අවශ්‍යතාව (පෝස්ට් මොඩර්න් කන්ඩිෂන්) අද ලෝ පුරා (අඩුම තරමින් බටහිරයන් ලෝකය ලෙස සලකන බටහිර) සපුරාලන බැවින් ය. එහෙත් ලියෝතාද් ඉහත සඳහන් නමින් ඇති තම පොතෙහි විස්තර කරන අවශ්‍යතාවන් ලෝකයේ නැති බව ඉතා පහසුවෙන් පෙන්වා දිය හැකිය. එබැවින් නිර්වචනයට අනුවම ඊනියා පශ්චාත් නූතනත්වයක් නැති බැවින් අද ලෝක දේශපාලනයෙහි ක්ෂුද්‍රභාවයක් ගැන කතා කිරීම තමන් පොරවල් වීමට දඟලන කිහිප දෙනකුට පමණක් සීමා වී ඇත.

බටහිර ලෝකයෙහි ඇත්තේ පහළොස් වැනි සියවසේදී ඇරැඹි බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ය. එහි සංස්කෘතිය යුදෙව් ක්‍රිස්තියානි වන අතර චින්තනය ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි වෙයි. මේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ඊනියා පුනරුදය, ප්‍රතිසංස්කරණය, ආලෝකනය ආදි වශයෙන් හැඳින්වෙන අවස්ථා ගණනක් නම් දැනට පසුකර ඇති බව පැහැදිලිය. යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය ලෝ පුරා ප්‍රචලිත කිරීම බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ප්‍රධාන ලක්ෂණයක් වෙයි. පසුගිය වසර පන්සියයකට අධික කාලයක් තිස්සේ කෙරීගෙන යන්නේ මුළු ලෝකයම යුරෝපීය කිරීමෙහි ක්‍රියාවලියය. එහි නායකත්වය දකුණු යුරෝපයේ ස්පාඤ්ඤය හා පෘතුගීසිය යන රටවලින් උතුරු යුරෝපයේ එංගලන්තය, නෙදර්ලන්තය, ප්‍රංශය ආදී රටවලටද ඉන්පසු අද වන විට ඇමරිකා එක්සත් ජනපද හෙවත් ඇමරිකාවටද හිමි වී ඇත. යුදෙව්වන් හා කතෝලික නොවන ක්‍රිස්තියානීන් අතර ඇත්තේ එක පවුලක ඥාතීන් අතර ඇති අන්දමේ සම්බන්ධයකි. ඔවුන් ඇතැම් අවස්ථාවල එකිනෙකා සමඟ සටන් කරනු දැකිය හැකිය. එහෙත් ඒ අතර ඥාතීත්වය හේතු කොටගෙන ඔවුනොවුන් බොහෝ විට එකට ක්‍රියාකරනු දැකිය හැකිය. මාටින් ලූතර් වැන්නන්ගේ ව්‍යාපාරයෙහි නැවතත් පොතට යැමක් ගැන කියැවෙයි. එහිදී සිදුවූයේ පහළොස් වැනි සියවසේ කතෝලික චින්තනයෙන් කැඩීගොස් ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය ඇරැඹීමේ ක්‍රියාවලියට ආගමික ස්වරූපයක් ලබාදීමය. ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි ඇතැම් කරුණු යුදෙව් චින්තනයෙන් ලැබී ඇත. එලෙසම යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ඇතැම් අංගද ලැබී ඇත්තේ යුදෙව් සංස්කෘතියෙනි. බටහිර ලෝකයෙහි යුදෙව්වන්ට විරුද්ධව මෑතකදී සටන් වැදුණේ කතෝලික චින්තනය මත පදනම් වූ හිට්ලර් වීමත් ඔහුට සහාය ලැබුණේ එලෙසම කතෝලික චින්තනය මත එවකට පදනම්ව සිටි මුසෝලිනීගේ ඉතාලියෙන් වීමත් පුදුමයට කරුණු නොවෙයි.

ලෙබනනයේත් ලංකාවෙහිත් සිදු වන්නේ එකම ක්‍රියාවලියකි. එය වෙනස් යැයි අපට කියා දෙන්නේ බටහිරයන් ය. අපට අපේ ප්‍රවාද ඔස්සේ ලෝකය බැලූ විට පෙනෙන්නේ වෙනත් දෙයකි. අද ලෙබනනයේ යුද්ධ කිරීමට අනුබල ලැබෙයි. ඒ යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය වෙනුවෙන් ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය වෙනුවෙන් ය. අද බටහිරයන්ට මුස්ලිම් සංවිධානයක් වූ හමාස් සංවිධානයත්, මුස්ලිම් සංස්කෘතියත් විනාශ කිරීමෙහි අවශ්‍යතාව වෙයි. ඒ කළ හැක්කේ යුදෙව් ඊශ්‍රායලය ඔස්සේ යුද්ධ කරමින්ය. ඊශ්‍රායලය නමින් රටක් බටහිර ආසියාවේ පිහිටුවීමට ඊනියා ඓතිහාසික සාධක ඇතත් ඒ පිහිටුවනු ලැබුයේ වැඩි වශයෙන්ම මුස්ලිම් සංස්කෘතිය නැති කිරීමටය. බටහිරයන් යුදෙව්වන් ඊශ්‍රායලයේ පදිංචි කරවීමට පෙර ඔවුන් ලංකාවේ පදිංචි කරවීම ගැනද සිතාබලා ඇත. ඒ කුමක් නිසාද යන්න එතරම් පැහැදිලි නැතත් බටහිරයන් එසේ සැලසුම් කරන්නට ඇත්තේ සිංහල බෞද්ධයන් කෙරෙහි පතළ කරුණාවෙන් නොවන බව නම් කිව හැකිය.

යුදෙව්වන් පදිංචිකිරීමට සුදුසුම ප්‍රදේශය බටහිර ආසියාව බව බටහිරයන් පසුව තීරණය කර ඇත. ලංකාවේ ඒ වන විටත් සිංහලයන්ට හා සිංහල සංස්කෘතියට එරෙහිව බටහිරයන් විසින් දෙමළ ජාතිවාදය යොදවා ගනු ලැබිණි. එබැවින් ලංකාවට යුදෙව්වන්ගේ අවශ්‍යතාවක් නොතිබෙන්නට ඇත. කෙසේ වෙතත් අද දෙමළ ජාතිවාදය ඉටු කරන්නේ බටහිරයන්ගේ අවශ්‍යතාව ය. දෙමළ ජාතිවාදය යනු බටහිර ක්‍රිස්තියානි නූතනත්වය විසින් සිංහලයන්ට විශේෂයෙන්ම සිංහල බෞද්ධයන්ට එරෙහිව යොදා ගැනෙන ආයුධය වෙයි. ඒ ආයුධය මොට කිරීමට කිසි විටෙකත් බටහිරයන් කටයුතු නොකරනු ඇත. ඇබවින් බටහිරයන්ට අනුව ලංකාවෙහි දෙමළ ජාතිවාදයට එරෙහිව සටන් නොකළ යුතුය. එහෙත් ලෙබනනයේ ක්‍රිස්තියානි නූතනත්වය වෙනුවෙන් මුස්ලිම් සංස්කෘතිය පරාජය කළ යුතුය. ලංකාවේ ඊනියා සාමයත් ලෙබනනයේ යුද්ධයත්, බටහිර ක්‍රිස්තියානි නූතනත්වය වෙනුවෙන් ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva